# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,269 - 2022 පෙබරවාරි මස 25 වැනි සිකුරාදා - 2022.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 110 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 111 |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 මාර්තු මස 18 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 මාර්තු මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය.”**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

109- B 082319 — 353 (2022/02)
D 1 -

# පිස්කල් විකිණීම්

## සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වන වගන්තියට එකඟව පිස්කල් විසින් කරනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ නිවේදනය

### දඹුල්ල දිසා අධිකරණයේ දී ය

නඩු අංකය : එම්. බී. 46
ස්වභාවය : මුදල්
වටිනාකම : රු. 2,952,188
ක්‍රියාපටිපාටිය : සාමාන්‍ය
ඇස්කිසි අංකය : 06/2021

සර්වෝදය එකොනොමික් එන්ටර්ප්‍රයිසස් ඩිවලොප්මන්ට්ස් සර්විසස් (ගරන්ටි) ලිමිටඩ් සමාගම,
(සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවා ඇපකර ආයතනය) SEEDS (Gurantee) Ltd. යන නාමයෙන් ද හැඳින්වේ.)
අංක 45,
''අර්ථධර්ම කේන්ද්‍රය''
රාවතාවත්ත,
මොරටුව.

............................*පැමිණිලිකරු.*

*එදිරිව*

1. මුහන්දිරම් රාළලාගේ විරාජිනී දසනායක,
අංක 19, ජාතික නිවාස, දඹුල්ල.

............................*විත්තිකරුවන්.*

වර්ෂ 2020 ක් වූ සැප්තැම්බර් මස 24 වැනි දින දඹුල්ල දිසා අධිකරණය විසින් ප්‍රකාශ කරන්නට යෙදුණු ඉහත නඩුවේ තීන්දුව ප්‍රකාරව ඉහත නම් සඳහන් 01 වන විත්තිකාරියගෙන් ''පැ 2'' දරන උකස්කරය මත පැමිණිලිකාර සමාගමට ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති ශ්‍රී ලංකාවේ මුදලින් රුපියල් විසි නම ලක්ෂ පනස් දෙදහස් එකසිය අසූ අට (රු. 2,952,188) ක මුදලක් ද වර්ෂ 2014.03.31 වැනි දින සිට නඩු තීන්දුවේ දිනය දක්වා රුපියල් විසි හතර ලක්ෂ විසි අට දහස් එකසිය අසූ පහ (රු. 2,428,185) ක හිඟ ණය මුදල මත වාර්ෂිකව 29% බැගින් පොළියක් ද නඩු තීන්දුවේ දින සිට නඩු තීන්දුවේ සඳහන් සම්පූර්ණ මුදල හා පොළිය ගෙවා නිම වන තෙක් ඒ මත නෛතික පොළිය සහ පැමිණිලිකාර ආයතනයේ ව්‍යාපාර පරිචය තුළ අය කෙරෙන ගාස්තු ආදිය ද නඩු ගාස්තු ද පැමිණිලිකාර සමාගමට අයකර ගැනීම සඳහා දඹුල්ල දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් තහනමට ගෙන ඇති පහත සඳහන් උපලේඛනයේ මැනවින් විස්තර කර ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2022 ක් වූ මාර්තු මස 24 වැනි දින පෙ. ව. 11.00ට** එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුරු කොට්ඨාසයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹුල්ල මහා නගර සභා බල සීමාව තුළ, වගපනහ පල්ලේසිය පත්තුවේ, පාදෙනිය දඹුල්ල (දඹුල්ල නගරය ග්‍රාම නිලධාරී වසමේ) පිහිටි **කුඹුරු වෙලේ යාය හෙවත් කුඹුරුවෙලේ යාය හෙවත් කුඹුරේ වෙලේ යාය** නමැති ඉඩමට දඹුල්ල බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න මහතා විසින් මැන සාදන ලද අංක 5398/2011.09.02 දරන පිඹුරේ කැබලි අංක : H ලෙස නිරූපිත එකී අංක : 5398 දරන පිඹුර ප්‍රකාරව, උතුරට : මෙම පිඹුරේ කැබලි අංක G ද, නැගෙනහිරට : මෙම පිඹුරේ කැබලි අංක L දරන අඩි 10ක් පළල පාරද, දකුණට : මෙම පිඹුරේ කැබලි අංක 1 ද, සහ බස්නාහිරට : තම්මැන්නා ඇල රක්ෂිතය ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහහතර (පර්. 14) ක් විශාල ඉඩමත්, ඒ මත පිහිටි ගහකොළ, පළතුරු ආදී සෑම සියළු දේත්, ඒ හා බැඳුනු සියලු අයිතිවාසිකම්, හිමිකම්, වරප්‍රසාද, ඵල ප්‍රයෝජන, පරවශ්‍යතා, හා අනුබන්ධනත් සහ මාර්ග අයිතිවාසිකම් ද සමග වේ.

(මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D308/285 හි ලියාපදිංචි වී ඇත.)

එස්. එම්. එස්. සී. සමරකෝන්,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
දඹුල්ල.

වර්ෂ 2022 ක් වූ ජනවාරි මස 27 වැනි දින දී ය.

02 - 301

## නොතාරිස් ලැයිස්තුව

### නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීමයි

මුල්ලේරියාව, නව නගරය, කැළණිමුල්ල, අංක 417/8 දරන ස්ථානයේ පදිංචි මධූෂිකා දුලානි ලියනගේ වන මම කොළඹ දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස 107 වැනි අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 07 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සියලුම මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

එම්. ඩී. ලියනගේ.

2021 දෙසැම්බර් මස 27 වැනි දින,
අංක 417/8, කැළණිමුල්ල,
මුල්ලේරියාව නව නගරය.

02-261

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.